# ලස්සන සමනලයා



වෙනුලි නෙතුම්සා හරස්ගම

# උස්සන සමනලයා

වෙනුලි නෙතුම්සා හරස්ගම

ප්‍රථම මුද්‍රණය : 2023

කර්තෘ : වෙනුලි නෙතුම්සා හරස්ගම

ලිපිනය : නො.44,
කෙලින් වීදිය,
තලාතුඔය.

ISBN අංකය : 978-624-206-855-8

මුද්‍රණය
"PRESS"
නොː 24, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

**නිති දැනුමෙන් පෝෂණය කරන්නට වෙර දරන,**

**මාගේ සදාදරණීය විදුහල්පතිතුමිය,**

**පන්තිභාර ගුරුතුමිය,**

**ඇතුළු ගුරු මව්පියවරුන්ටත්,**

**මා පෝෂණය කරන, ඇතිදැඩි කරන**

**මාගේ මව්නි, පියාණෙනි ඔබ දෙපලටත්,**

**මා වැනිම දැනුම හඹා යන**

**මාගේ සොයුරු කැළටත්**

**මේ පොත ආදරයෙන් පුද කරමි.**

* * *

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන ''විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-01-01

වෙනු හරිම අහිංසක ලස්සන ළමයෙක්. එයාට හිටියේ අම්මයි, තාත්තයි, මල්ලියි. මෙයාලා හරිම සතුටින් ජීවත් වුණ පවුලක්.



චෙනුගේ විනෝදාංශය තමා මල් වවන එක. එයාගේ ගෙදර වටේටම ලස්සන ලස්සන පාට පාට මල් හදලා තිබුණා.



වෙනුයි එයාගේ මල්ලියි මල් වත්ත හොඳින් බලා ගන්නවා. වෙනූ මල් වත්තට වතුර, පොහොර එහෙම දාන්න එනකොට මල්ලිත් උදව්වට එනවා.



දවසක් මේ දෙන්නා මල් වත්ත සුද්ද කර කර ඉන්න කොට වෙනුගේ මල්ලි දැක්කා මල් ගහේ අත්තක දළඹුවෙක් ඉන්නවා. මේ දළඹුවා මල් ගහේ කොළ ගොඩක් කාලා.



මල්ලි වෙනුට කතා කළා.

''අක්කේ.. අක්කේ.. ඉක්මනට එන්නකෝ. මේ බලන්නකෝ අක්කේ, මේ දළඹුවා මල් ගහේ කොළ ඔක්කෝම කාලා. මල් ගහ කැත වෙලා.''


මල්ලි හරිම දුකෙන් කිව්වා.



''අක්කේ.. මම දළඹුවාව විසි කරලා දාන්නම්.'' මල්ලි කිව්වා.

චෙනූ ඉක්මනට කිව්වා
''එපා එපා මල්ලී, එහෙම කරන්න එපා. පව්සිද්ධ වෙයි ඔයාට.''

චෙනූට ඉස්කෝලේ ටීච පරිසරය පාඩමට සමනලයාගේ ජීවන චක්‍රය කියා දුන් හැටි මතක් වුණා.



එයා මල්ලිට ඒ ගැන කියා දුන්නා.

''මල්ලි එන්නකෝ.. මෙතනින් වාඩි වෙන්නකෝ. මම ඔයාට දළඹුවා සමනලයා වෙන හැටි කියලා දෙන්නම්.''


අම්මයි, තාත්තයි මේ කතාව අහගෙන හිටියේ. වෙනු මල්ලිට කතාව කියන්න පටන් ගත්තා.



''ඔන්න සමනලයෙක් ඇවිත් ගහක අත්තක කොළේක බිත්තර ටිකක් දානවා. ටිකක් දවස් ගියාට පස්සේ ඒකෙන් දළඹුවෙක් එළියට එනවා. එයා ගහේ කොළ කනවා. ඇති වෙනකල්ම කනවා.



එයා එහෙම කොළ ගොඩක් කෑවාම එයා ලොකු වෙනවා. ඊටපස්සේ ටිකක් දවස් ගියාට පස්සේ ඒ දළඹුවා ගහක අත්තක එල්ලිලා කෝෂයක් හදාගන්නවා. අව්වෙන්, වැස්සෙන්, සත්තුන්ගෙන් ආරක්ෂා වෙන්න ඒ කෝෂය ඇතුළේ ටිකක් දවස් හිටියාම එයා ලස්සන සමනලයෙක් වෙලා එළියට එනවා.




අපේ මේ ඉන්න දළඹුවත් ටික දවසකින් ලස්සන සමනලයෙක් වෙලා අපේ මල් වත්තේ මල් වලින් පැණි බොන්න එයි. ’’

මේ දෙන්නා හැමදාම දළඹුවාව බලන්න එනවා.



දවසක් බලනකොට ඇත්තට ම කෝෂයක් මල් අත්තේ එල්ලිලා තියනවා දැක්කා. මේ දෙන්නට හරිම සතුටුයි.

මේ ගැන අම්මටයි, තාත්තටයි ගිහින් කිව්වා. ටිකක් දවස් ගියා.



එක දවසක් උදේ වෙනුගේ මල් වත්තේ ලස්සනම ලස්සන සමනලයෙක් පියාඹනවා වෙනූ දැක්කා.

එයා මල්ලිට කතා කළා.
''මල්ලී... අර බලන්න අර දළඹුවා ලස්සන සමනලයෙක් වෙලා මගේ වත්තේ හැම මලකටම පියාඹනවා.''



‘‘අක්කේ... ඇත්තටම ලස්සන සමනලයෙක් තමා එයා.’’ මල්ලි කිව්වා.

වෙනූටයි මල්ලිටයි හරිම සතුටුයි.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023-11-01